14365

AL/2016/52-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2016 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2016**

| | | |
|---|---|---|
| නර්තනය - (දේශීය) I<br>நடனம் - (தேசிய) I<br>Dancing - (Indigenous) I | **52 S I** | *පැය දෙකයි*<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

විභාග අංකය : ........................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 14 | |
| 03 | 15 - 23 | |
| 04 | 24 - 36 | |
| 05 | 37 - 46 | |
| 06 | 47 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**
- ※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- ※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** 'සිංහල නර්තන කලාව' සහ 'පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය' යන කෘති රචනා කරන ලද්දේ,
(1) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය.
(2) මුදියන්සේ දිසානායක සහ ජයසේන කෝට්ටගොඩ ය.
(3) තිස්ස කාරියවසම් සහ එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(4) තිස්ස කාරියවසම් සහ ලයනල් බෙන්තරගේ ය.
(5) එදිරිවීර සරච්චන්ද්‍ර සහ ජයසේන කෝට්ටගොඩ ය. (.........)

**2.** කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි ලෙස සැලකෙන්නේ,
(1) මල පේ කිරීම සහ මිල්ල කැපීම ය.
(2) මල පේ කිරීම සහ බිසෝ කප සිටුවීම ය.
(3) තොට පේ කිරීම සහ බිසෝ කප සිටුවීම ය.
(4) හඟලේ යැදීම සහ අයිලේ යැදීම ය.
(5) හඟලේ යැදීම සහ ගිනි පෑගීම ය. (.........)

**3.** හත් අඩියේ කවි ගායනා දැකිය හැක්කේ,
(1) කොහොඹා කංකාරියේ දී ය.
(2) දෙවොල් මඩුවේ දී ය.
(3) සූනියමේ දී ය.
(4) පහන් මඩුවේ දී ය.
(5) රටයකුමේ දී ය. (.........)

**4.** දිව්දොස් පුවත පිළිබඳ සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය කෘති **දෙකක්** වන්නේ,
(1) කුවේණි අස්න හා සිහබා අස්න ය.
(2) කුවේණි අස්න හා දඹදෙණි අස්න ය.
(3) දීප වංශය සහ මහා වංශය ය.
(4) දීප වංශය සහ රාජාවලිය ය.
(5) මහා වංශය සහ රාජාවලිය ය. (.........)

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

**47.** බලි ශාන්තිකර්මයේ දී පුද පූජා ඉටු කෙරෙන්නේ කුමන කොට්ඨාසයක් වෙනුවෙන් ද? ..............................

එහි දී බලි ඇඹීම සඳහා උපයෝගී කොට ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍යය කුමක් ද? ..............................

**48.** පහත සඳහන් දක්ෂිණ භාරතීය පැලඳුම් කොටස් අයත් වන නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

**1.** කුප්පායම් : ..............................

**2.** රාක්කුඩි : ..............................

**49.** "අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා දමන්නී"

මෙය අයත් වන ගැමි නාටකය සහ චරිතය කුමක් ද?

**1.** ගැමි නාටකය : .............................. **2.** චරිතය : ..............................

**50.** 'ගුණතුංග දිනපතා පන්සල වෙත යන්නේ තම ආගමික වත්පිළිවෙත් ඉටු කිරීම සඳහා ය. බුදුන්ට මල් පහන් පුදා භාවනානුයෝගී ව සිටීම ඔහුගේ මානසික සුවයට මහත් රුකුලක් වන්නේ ය.' මෙයින් කියැවෙන භාවය හා රසය නම් කරන්න.

**1.** භාවය : .............................. **2.** රසය : ..............................

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

5. තෙල්මේ නැටීම සහ වාහල නැටීම නම් විශේෂ නර්තන අංග **දෙක** දැකිය හැක්කේ,
(1) උඩරට ගම්මඩුවේ දී ය. (2) සබරගමු ගම්මඩුවේ දී ය.
(3) සබරගමු පහන් මඩුවේ දී ය. (4) සබරගමු දෙවොල් මඩුවේ දී ය.
(5) පහතරට දෙවොල් මඩුවේ දී ය. (.........)


6. ආගමික හා සාමාජීය උත්සව සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩ වන්නේ,
(1) දවුල, තම්මැට්ටම සහ ගැටබෙරයයි. (2) දවුල, තම්මැට්ටම සහ හොරණෑවයි.
(3) ගැටබෙරය, දවුල සහ තාලම්පටයි. (4) පහතරට බෙරය, ගැටබෙරය සහ හොරණෑවයි.
(5) ගැටබෙරය, තම්මැට්ටම සහ අඬ බෙරයයි. (.........)

7. අනුපිළිවෙළින් උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායවල ශිල්පීය දක්ෂතා ඇති ප්‍රවීණ නර්තන ශිල්පීන් ලෙස නම් කළ හැක්කේ,
(1) පණීභාරත, චිත්‍රසේන ඩයස් සහ ජී. වී. හීන්නිලමේ ය.
(2) පණීභාරත, කේ. ඇස්. ප්‍රනාන්දු සහ ජී. වී. හීන්නිලමේ ය.
(3) පණීභාරත, සව්රිස් සිල්වා සහ ඒ. ඉඹුල්ගොඩ ය.
(4) චිත්‍රසේන ඩයස්, කේ.ඇස්. ප්‍රනාන්දු සහ ඒ. ඉඹුල්ගොඩ ය.
(5) චිත්‍රසේන ඩයස්, සව්රිස් සිල්වා සහ ජේ. ඊ. සේදරමන් ය. (.........)

8. බලි ශාන්තිකර්මයට විශේෂිත වූ ගායනා ලෙස සැලකෙන්නේ,
(1) ඇඹුම් කවි, ග්‍රහ පන්ති, මල්යහන් කවි ය. (2) උඩැක්කි කවි, සිරසපාද කවි, ග්‍රහ පන්ති ය.
(3) මල්යහන් කවි, පන්තේරු කවි, යාග කවි ය. (4) ඇඹුම් කවි, ග්‍රහ පන්ති, හිං හතරේ කවි ය.
(5) ග්‍රහ පන්ති, උඩැක්කි කවි, හිං හතරේ කවි ය. (.........)

9. සූනියම සහ රටයකුම යන ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය නර්තන අංග ලෙස සැලකෙන්නේ,
(1) වඩිග පටුන සහ මරා ඉපැද්දීමයි. (2) වඩිග පටුන සහ කපුයක්කාරියයි.
(3) නානුමුරය සහ මරා ඉපැද්දීමයි. (4) කපුයක්කාරිය සහ දරු නැළවිල්ලයි.
(5) වඩිග පටුන සහ මරා ඉපැද්දීමයි. (.........)

10. ඉදිරිපස දී ඇති රූපයෙන් දැක්වෙන්නේ,
(1) පත්තිනි තොරණයි.
(2) දෙවොල් තොරණයි.
(3) රටයකුම් වීදියයි.
(4) සූනියම් වීදියයි.
(5) සන්නියකුම් වීදියයි. (.........)



11. කෝලම් නාටකයේ අතිමානුෂ චරිත ලෙස සැලකෙන්නේ,
(1) පූර්ණක සහ ලියන අප්පු ය. (2) පූර්ණක සහ මුදලි ය.
(3) ගුරුළු රාක්ෂ සහ නාග රාක්ෂ ය. (4) ගුරුළු රාක්ෂ සහ මුදලි ය.
(5) නාග රාක්ෂ සහ මනමේ රජු ය. (.........)

12. 'ලෙළ දුන් නව තඹ පලු වන් පාදේ' මෙම කාව්‍යය අයත් සාහිත්‍ය කෘතිය හා එය රචනා වූ යුගය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පරෙවි සංදේශය - ගම්පල යුගය (2) ගිරා සංදේශය - ගම්පල යුගය
(3) සැළලිහිණි සංදේශය - කෝට්ටේ යුගය (4) කොවුල් සංදේශය - කෝට්ටේ යුගය
(5) සැවුල් සංදේශය - කෝට්ටේ යුගය (.........)

13. 'අක්කා ඉතින් නාඬන්නේ' මෙහි
(1) ලඝු 01 ගුරු 06 සඳැස්මත් 14 කි. (2) ලඝු 01 ගුරු 06 සඳැස්මත් 13 කි.
(3) ලඝු 02 ගුරු 06 සඳැස්මත් 13 කි. (4) ලඝු 02 ගුරු 05 සඳැස්මත් 11 කි.
(5) ලඝු 03 ගුරු 05 සඳැස්මත් 10 කි. (.........)

14. "ජිං කඩතක ජිං කුකුතක/ගදිත ගතම දොම් ගදිතම්/ජිං කිටිතත් තත් කිටිතක" මෙය,
(1) මාත්‍රා 4 + 4 තනිතිත ය. (2) මාත්‍රා 2 + 4 දෙතිත ය.
(3) මාත්‍රා 2 + 3 දෙතිත ය. (4) මාත්‍රා 3 + 3 තනිතිත ය.
(5) මාත්‍රා 2 + 2 + 4 තුන්තිත ය. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**37.** කර්ණාටක තාල පද්ධතියෙහි තාල හා ජාති වශයෙන් වර්ගීකරණය සංඛ්‍යාත්මක ව දක්වන්න.

1. තාල : .................................... 2. ජාති :...................................................

**38.** පහත දැක්වෙන නෘත්‍ය නාටක නිෂ්පාදනය කළ ශිල්පියා සහ ශිල්පිණිය නම් කරන්න.

1. චිත්‍රාංගදා: ........................................ 2. රාම් ලීලා :...............................................

**39.** පහත දැක්වෙන නර්තන අංග අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායට ද?

1. ගෙජ්ජි මාත්‍රය : .................................. 2. පට්ටුතාල් මාත්‍රය :...........................................

**40.** කාවඩි නර්තනයට භාවිත කෙරෙන අවනද්ධ භාණ්ඩය සහ සුෂිර භාණ්ඩය කුමක් ද?

1. අවනද්ධ භාණ්ඩය: ...................................................

2. සුෂිර භාණ්ඩය :......................................................

**41.** පහතරට නර්තනයේ ප්‍රවීණ නර්තන ශිල්පී කේ. ඇස්. ප්‍රනාන්දු මහතා විසින් වේදිකාවට සකස් කරන ලද නර්තන අංග **දෙකක්** නම් කරන්න.

1. :.................................................... 2. :........................................................

**42.** 'වඩිග පටුන' හා 'සූනියම් යක්ෂණිය' රංගනය කෙරෙන ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.

1. වඩිග පටුන :...................................... 2. සූනියම් යක්ෂණිය :........................................

**43.** මාර්තා ග්‍රැහැම් සහ ජීන් ජෝර්ජ් නෝවේර් යන ශිල්පීන් දෙදෙනා අයත් රටවල් මොනවා ද?

1. ................................................ 2. ........................................................

**44.** 'ගුරුගේ මාලාව' සහ 'මරුවා නැටීම' යන නාට්‍යමය නර්තන ඇතුළත් ශාන්තිකර්ම නම් කරන්න.

1. ගුරුගේ මාලාව : ..........................................................................................

2. මරුවා නැටීම :............................................................................................

**45.** ප්‍රේමකුමාර එපිටවෙල විසින් නිර්මාණය කරන ලද වන්නම කුමක් ද? ......................................

එය නම් කරන ලද්දේ කී වෙනි වන්නම ලෙස ද? ..........................................................

**46.** පහත ඡායාරූපවලින් දැක්වෙන ශාන්තිකර්මය හා නර්තනාංගය නම් කරන්න.






1. ශාන්තිකර්මය : ..........................................................................................

2. නර්තනාංගය : ..........................................................................................


Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka


**15.** පහත සඳහන් (I) (II) (III) (IV) යන අංකවලින් දැක්වෙන හස්ත මුද්‍රා පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.




I



II



III



IV

(1) අංක I හා II සම්යුත හස්ත වේ.
(2) අංක I හා II අසම්යුත හස්ත වේ.
(3) අංක I හා III සම්යුත හස්ත වේ.
(4) අංක III හා IV සම්යුත හස්ත වේ.
(5) අංක III හා IV අසම්යුත හස්ත වේ. (.........)

**16.** 'කල්පනා' හා 'ජීවන රිද්මය' යන භාරතීය නෘත්‍ය නාටක නිර්මාණය කරන ලද්දේ,
(1) උදය ශංකර් ය.
(2) ශ්‍රීමතී මේනකා ය.
(3) රුක්මිණී අරුන්ඩේල් ය.
(4) ගෝපිනාත් ය.
(5) රාම් ගෝපාල් ය. (.........)

**17.** 'කිංකිණි කෝලම' සහ 'රන්දද' යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ශිල්පීන් වන්නේ,
(1) චිත්‍රසේන සහ ශේෂා පලිහක්කාර ය.
(2) චිත්‍රසේන සහ ශාන්ති දේවි ඝෝෂ් ය.
(3) ඉඹුල්ගොඩ සහ වසන්ත කුමාර ය.
(4) චිත්‍රසේන සහ ඉඹුල්ගොඩ ය.
(5) ඉඹුල්ගොඩ සහ ශේෂා පලිහක්කාර ය. (.........)

**18.** ලක්නව් ඝරානාවේ ප්‍රවීණ කථක් ශිල්පීන් ලෙස කටයුතු කරන ලද්දේ,
(1) දුර්ගා ප්‍රසාද් සහ අච්චන් මහරාජ් ය.
(2) ක්‍රිෂ්ණ අයියර් සහ අච්චන් මහරාජ් ය.
(3) ක්‍රිෂ්ණ අයියර් සහ සුන්දර් ප්‍රසාද් ය.
(4) දුර්ගා ප්‍රසාද් සහ බ්‍රිර්ජු මහරාජ් ය.
(5) අච්චන් මහරාජ් සහ බ්‍රිර්ජු මහරාජ් ය. (.........)

**19.** කථකලි නර්තනය සඳහා බලපෑ ජන නාටක වන්නේ,
(1) රාමනාට්ටම්, කුඩිආට්ටම් සහ අට්ටකථා ය.
(2) කුඩි ආට්ටම්, ක්‍රිෂ්ණාට්ටම් සහ බාන යුද්ධ ය.
(3) රාමනාට්ටම්, කුඩියාට්ටම් සහ චකියාර්කුත්තු ය.
(4) චකියාර්කුත්තු, කුඩියාට්ටම් සහ අට්ට කථා ය.
(5) චකියාර්කුත්තු, රාමනාට්ටම් සහ බාන යුද්ධ ය. (.........)

**20.** ශාන්ති දේවි ඝෝෂ් විසින් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද මුද්‍රා නාට්‍ය ලෙස දැක්වෙන්නේ,
(1) ඡන්දන්තදායම් හා කිඳුරගන ය.
(2) ඡද්දන්තදායම් හා වේදනා ය.
(3) සීතාහරණ හා වේදනා ය.
(4) සීතාහරණ හා මනෝහාර බන්ධනම් ය.
(5) මනෝහාර බන්ධනම් හා විධුර ය. (.........)

**21.** දක්ෂිණ භාරතීය භරත නාට්‍යම් නර්තනයට යොදා ගන්නා සුවිශේෂ තත් භාණ්ඩය වන්නේ,
(1) සිතාරයයි. (2) වීණාවයි. (3) එස්රාජයයි. (4) තාම්පුරාවයි. (5) ජේනාවයි. (.........)

**22.** විසිවන සියවසේ 'හංසවිල' බැලේ නාට්‍යය සඳහා දායක වූ ප්‍රවීණ සංගීතඥයා සහ හංස ධේනුවගේ චරිතයට පණ දුන් ප්‍රවීණ නිළිය වන්නේ,
(1) චෛකොවස්කිව් සහ ඉසඩෝරා ඩන්කන් ය.
(2) ජීන් ජෝර්ජ් නෝවේර් සහ ඉසඩෝරා ඩන්කන්ය.
(3) චෛකොවස්කිව් සහ ගලිනා උලනෝවා ය.
(4) ගලිනා උලනෝවා සහ මාරියස් පෙටිපා ය.
(5) වස්ලව් නිජින්ස්කි සහ තාමරා තව්මනෝවා ය. (.........)

**23.** අනුපිළිවෙළින් උඩරට පහතරට සහ සබරගමු ඇඳුම් කට්ටලවලට ආවේණික කොටස් ලෙස සැලකෙන්නේ,
(1) ගිඩාබන්ධනය, අවුල්හැරය, කෛමෙත්තයි.
(2) සිළුමිණ, පච්ච වඩම, තෝඩුපත් ය.
(3) තෙල් කච්චිය, ජටාව, සිළුමිණයි.
(4) තෙල් කච්චිය, හැඩකෑල්ල, සිළුමිණයි.
(5) ගිඩාබන්ධනය, තෙල් කච්චිය, සිළුමිණයි. (.........)

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka


14365

**24.** ප්‍රාසංගික වේදිකාවක කණ්ඩායම් නර්තනයක් නිර්මාණය කිරීමේ දී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) පුද්ගල හා පොදු අවකාශයට රංග වස්ත්‍රාභරණ සැලසුම් කිරීම ගැන ය.
(2) පුද්ගල හා පොදු අවකාශයට රංග වින්‍යාසය සැලසුම් කිරීම ගැන ය.
(3) පුද්ගල අවකාශයට ඇඳුම් පැලඳුම් සකස් කිරීම ගැන ය.
(4) පුද්ගල හා පොදු අවකාශයට පසුතල නිර්මාණය සැලසුම් කිරීම ගැන ය.
(5) පොදු අවකාශයට රංග භාණ්ඩ සැලසුම් කිරීම ගැන ය. (.........)

**25.**



A



B

ඉහත රූපවල රසභාව අනුපිළිවෙළින්,
(1) අද්භූත හා රෞද්‍ර රසය වේ. (2) අද්භූත සහ වීර රසය වේ.
(3) රෞද්‍ර හා වීර රසය වේ. (4) භයානක හා වීර රසය වේ.
(5) භයානක හා අද්භූත රසය වේ. (.........)

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** මීනාක්ෂි සුන්දරම්පිල්ලේ වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ දක්ෂිණ භාරතීය ................................ නර්තනය සඳහා ය.

**27.** මල් මඬුපුරය, දේව කෝල්පාඩුව සහ යහන් දැක්ම යන නර්තන අංග දැකිය හැකි වන්නේ ................................ ශාන්තිකර්මයේ දී ය.

**28.** තිසරා, ආනන්ද සහ නාග ගජගා යන වන්නම් අයත් වන්නේ ................................ නර්තන සම්ප්‍රදායට ය.

**29.** අනුරාගදණ්ඩ තාලය අයත් වන්නේ ................................................නර්තන සම්ප්‍රදායේ වන්නමක ය.

**30.** නර්තනයේ දී ශරීරයේ උපාංග කොටස් හැඟීම් දනවන අයුරින් මැනවින් පිළිබිඹු වන්නේ ................................ අභිනයේ දී ය.

**31.** "නිතිනි දන මන නයන පිනවන - දුල් සිරින් දෙවඟනක විලසා" මෙය ................................ සවුදම ලෙසින් හඳුන්වයි.

**32.** ඉතාලිය, ප්‍රංශය, රුසියාව ........................... නර්තනයේ ආරම්භය සහ විකාශනයට දායක වූ ප්‍රධාන රටවල් ලෙස සැලකේ.

**33.** වැදි යකුන්, මෙලෙයි යකුන් සහ රුප්පා යකුන් පුද ලබන්නේ ........................................ ශාන්තිකර්මයේ දී ය.

**34.** "ආංගිකම් භුවනම් යස්‍ය වාචිකම් සර්වවාංමයම් ආහාර්යම් චන්ද්‍ර තාරා දි තං නුමඃ සාත්විකම් ශිවම්" මෙම ශ්ලෝකය ................................ නමස්කාරය ලෙස හැඳින්වේ.

**35.** විවිධ වූ චරිත නිරූපණය කිරීම සඳහා වේශ නිරූපණයට ප්‍රධාන තැනක් දෙන දක්ෂිණ භාරතයේ ................................ නර්තනය සාත්වික අභිනයෙන් වඩාත් පොහොසත් ය.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර **තිත් ඉර** මත ලියන්න.

**36.** සෞන්දර්ය ගුරු විද්‍යාල ස්ථාපිත කළ ස්ථානය හා වර්ෂය කුමක් ද?

**1.** ස්ථානය : ........................................ **2.** වර්ෂය :........................................................

Department of Examinations Sri Lanka

AL/2016/52-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| නර්තනය - (දේශීය) II<br>நடனம் - (தேசிய) II<br>Dancing - (Indigenous) II | 52 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

* I වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II, III, IV කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම (i) කොටසට ලකුණු 06 ක් ද (ii) කොටසට ලකුණු 06ක් ද (iii) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන, ප්‍රස්තාර කරන්න.

(අ) "දොම්ත තදොම් තදොම් රුඳ ගජිං තකට ගත කුඳ ගත"

(ආ) "දොං දොං ගත ගත් දිත් තකු"

(ඇ) "ජිං කිටිතක් තත් කිටිතක"

(ii) පහත සඳහන් කවි පදය මාත්‍රා 3 + 4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"යනෙන කළු ගඟ එතෙර වැඩ සිට
රුපුන් යන මං බලව බලවා"

(iii) 'දොං ජිංත ගත දොංත' වට්ටමේ අඩව්වක් හෝ 'ගුඳ ගති ගත' වට්ටමේ සුරලක් හෝ 'යාදිනි මාත්‍රයේ' අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** "ශාන්තිකර්ම පැවැත්වීම මගින් සමාජ සහජීවනය සහ සම්බන්ධතා වර්ධනය වේ."

(i) කොහොඹා කංකාරිය පැවැත්වීමේ දී සමාජ සහජීවනය වර්ධනය වන ආකාරය පැහැදිලි කරන්න.

(ii) දෙවොල් මඩුව හෝ පහන් මඩුවේ දී දැකිය හැකි ඇදහිලි හා විශ්වාස පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) සමාජයේ යහපැවැත්ම සඳහා ශාන්තිකර්ම බලපාන ආකාරය විග්‍රහ කරන්න.

**3.** ආගමික හා සමාජීය අවස්ථාවල දී සාම්ප්‍රදායික හේවිසි වාදනය මෙන් ම ආනුෂංගික කලාවලට ද හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි.

(i) දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත වන සමාජ අවස්ථා **තුනක්** නම් කර, ඉන් එක් අවස්ථාවක වාදනය සිදු කෙරෙන ආකාරය විස්තර කරන්න.

(ii) ශාන්තිකර්මවල අන්තර්ගත වාදන අවස්ථා පිළිබඳ කරුණු දක්වන්න.

(iii) වෙස් ඇඳුම් කට්ටලය, තෙල්මේ ඇඳුම් කට්ටලය සහ සබරගමු ප්‍රධාන ඇඳුම් කට්ටලය අතුරෙන් **දෙකක්** තෝරා ගෙන, ඒවායේ විවිධත්වයට බලපා ඇති හේතු විග්‍රහ කරන්න.

## II කොටස

**4.** දේශීය නර්තන ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී වංශ කතා, රූකම් සහ ඓතිහාසික සාධක වැදගත් වේ.

(i) වංශකතා ඇසුරෙන් අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) ගම්පළ යුගයේ රූකම් ඇසුරෙන් හෙළි වන නර්තන කලා තොරතුරු සැකෙවින් විස්තර කරන්න.

(iii) ක්‍රි. ව. 1930 - 1960 දක්වා දේශීය නර්තනයේ ප්‍රවර්ධනයට බලපෑ සාධක **හතරක්** දක්වන්න.

**5.** (i) "දේශීය ජනකලාව, ජන සංගීතය හා බැඳී පවතී." සනාථ කරන්න.

(ii) "කෝලම්, සොකරි නාටකවල චරිත ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා බෙරපද සහ කවි ගායනා වඩාත් ඉවහල් වේ." එක් නාටකයකින් එක් චරිතයක් බැගින් තෝරා ගෙන, චරිත **දෙකක්** පිළිබඳ ව විමසන්න.

(iii) සම්බන්ධතා සංකල්පය රංග වින්‍යාසයේ දී යොදා ගෙන ඇති අයුරු පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ), (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| රබීන්ද්‍රනාත් තාගෝර් | තෝඩායම් | මෘදංගය - නටුවාංගම් |
| බ්‍රිර්ජු මහරාජ් | වර්ණම් | පුං - පෙනා |
| නාහර් සිං කුමාර් | ඨුම්රි | පඛ්වාජ් - හාර්මෝනියම් |
| රාජා ජමොරින් | රාස්ලීලා | චෙන්ඩා - මද්දලම් |

(i) (අ) කොටසෙහි ඇතුළත් කථක් නර්තන ශිල්පියා පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(ii) (ආ) කොටසෙහි ඇතුළත් මනිපුරි නර්තන අංගය පිළිබඳ ව විස්තර කරන්න.

(iii) (ඉ) කොටසෙහි ඇතුළත් කථකලි වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව විග්‍රහ කරන්න.

7. (i) දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය හඳුන්වන්න.

(ii) ඇනා පාව්ලෝවා, ගලීනා උලනෝවා, නිජින්ස්කි වස්ලව් යන අය අතුරෙන් එක් අයකුගෙන් බටහිර බැලේ රංග කලාවට සිදු වූ සේවය අගයන්න.

(iii) 'කරදිය' මුද්‍රා නාට්‍යයේ අවස්ථා තීව්‍ර කිරීම සඳහා යොදා ගෙන ඇති ශිල්පක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

## IV කොටස

8. "නූතන ප්‍රාසංගික නර්තනයට පෙරදිග මෙන් ම අපරදිග ආභාසය ද ලබා ඇති බැව් රූපවාහිනී නර්තන වැඩසටහන් නැරඹීමෙන් පැහැදිලි වේ."

(i) නර්තන සංචලන කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා නූතන තාක්ෂණික ශිල්පක්‍රම යොදා ගෙන ඇති ආකාරය පරීක්ෂා කරන්න.

(iii) පාසල් දරුවන්ගේ තරගකාරීත්වය සඳහා රූපවාහිනී රියැලිටි (Reality) නර්තන වැඩසටහන් මගින් රුකුලක් ලැබේ ද? විචාරයට ලක් කරන්න.

9. (i) නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා ජන සන්නිවේදන මාධ්‍ය බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.

(ii) "අද්‍යතන සමාජ අවශ්‍යතා සහ රුචිකත්ව නර්තන කලාව කෙරෙහි විවිධ අයුරෙන් බල පා ඇත." විමසන්න.

(iii) නර්තන කලාවේ පැවැත්ම සහ ප්‍රවර්ධනය සඳහා නර්තන අධ්‍යාපනයේ ඇති වැදගත්කම අගයන්න.

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka